තැ.පෙ.
த.பெட்டி 572
P.O. Box

දුරකථන
தொலைபேசி 2430860-9
Telephone 2430870-8

මගේ අංකය
எனது இல MOD/DEF/08/05/OA/NTA
My No

ඔබේ අංකය
உமது இல
Your No

ආරක්ෂක අමාත්‍යාංශය, අංක: 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
பாதுகாப்பு அமைச்சு, இல:15/5, பாலதக்ஷ மாவத்தை, கொழும்பு -03, இலங்கை.
MINISTRY OF DEFENCE, No:15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka


දිනය
திகதி 2018 අප්‍රේල් 03
Date

NAVAL HEADQUARTERS
09 APR 2018
SECRETARIAT

DIRECTOR GENERAL
16 APR 2018
BUDGET & FINANCE

අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

යුද්ධ හමුදාධිපති,

නාවික හමුදාධිපති,

ගුවන් හමුදාධිපති,

ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටිය දී ඉදුරාම ත්‍රස්තවාදී නොවන හේතු මත මියගිය හා ආබාධිත වූ රණවිරුවන් සඳහා සහ ක්‍රියාන්විත නොවන ප්‍රදේශවල මෙහෙයුම් රාජකාරීවල යෙදී සිටිය දී මියගිය හා ආබාධිත වූ රණවිරුවන් සඳහා සහන සැලසීම

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 18/0111/703/007 හා 2018.01.03 දිනැති අමාත්‍ය මණ්ඩල සටහනෙහි පහත කරුණු සඳහා 2018.03.20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇති බැවින් ඉදිරි කටයුතු කඩිනමින් ඉටු කරන ලෙස කාරුණිකව දන්වමි.

1.1 එබැවින් අමප/07/2081/305/082 හා 2007.11.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ සංදේශයේ 4(V) ඡේදය පහත පරිදි සංශෝධනය කර ඇත.

(අ) ක්‍රියාන්විත ප්‍රදේශවලදී ඉදුරාම ත්‍රස්තවාදී ක්‍රියා නොවන හේතු මත සහ ක්‍රියාන්විත නොවන ප්‍රදේශවල මෙහෙයුම් රාජකාරීවල යෙදී සිටියදී ස්ථිර ආබාධිතව, ආබාධිත බව හමුදා සේවයට අදාළ වීම සහ හමුදා සේවයේ නිරත වීමට නොහැකි යැයි වෛද්‍ය මණ්ඩලයක් විසින් නිර්දේශ කරන අවස්ථාවලදී, සහ

(ආ) ක්‍රියාන්විත ප්‍රදේශවලදී ඉදුරාම ත්‍රස්තවාදී ක්‍රියා නොවන හේතු මත සහ ක්‍රියාන්විත නොවන ප්‍රදේශවල මෙහෙයුම් රාජකාරීවල යෙදී සිටියදී මියගිය අවස්ථාවලදී

එලෙස ආබාධිත වූ රණවිරුවන් හා මියගිය රණවිරුවන්ගේ යැපෙන්නන්ට රණවිරුවාගේ වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ගෙවීම, වයස අවුරුදු 55 දක්වා වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම හා වයස අවුරුදු 55 දී ලබන වැටුප අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කර ගෙවීම

(ඇ) ක්‍රියාන්විත ප්‍රදේශවලදී ඉදුරාම ත්‍රස්තවාදී ක්‍රියා නොවන හේතු මත සහ ක්‍රියාන්විත නොවන ප්‍රදේශවල මෙහෙයුම් රාජකාරීවල යෙදී සිටියදී ආබාධිත වූ රණවිරුවකු දුබලතාවයට පත්ව එම දුබලතාවය හේතුවෙන්ම වයස අවුරුදු 55 එළඹීමට පෙර මිය ගියහොත් රණවිරුවාගේ වයස අවුරුදු 55 දක්වා යැපෙන්නන් වෙත වැටුප් හා දීමනා හිමි කරවීම

329/07

15

(ඇ) මෙම තීරණ ක්‍රියාත්මක වන දිනය අතීතයටද බලපාන පරිදි 1977.07.22 දින සිට ක්‍රියාත්මක වීම සහ 2009.05.19 දින දක්වා වූ සිදුවීම්වලට පමණක් අදාළ කර ගැනීම

(ඉ) උක්ත (අ) හා (ආ) හි සඳහන් පරිදි වන හිමිකම් ලබාදීමේදී, රා.ප.ච.22/93 හා එහි සංශෝධන අනුව දැනට මෙම රණවිරුවන් කාණ්ඩ 04 ක් යටතේ සිටින බැවින්

- I කාණ්ඩය වන මියගිය අයවළුන් සඳහා උක්ත (ආ) ප්‍රතිපාදන අදාළ කර ගැනීම
- II හා III කාණ්ඩ වන සදා සම්පූර්ණ ආබාධිත හා සදා අර්ධ ආබාධිත අයවළුන් සඳහා උක්ත (අ) ප්‍රතිපාදන අදාළ කර ගැනීම
- IV කාණ්ඩය වන තාවකාලික අර්ධ ආබාධිත අයවළුන් ස්ථිර ආබාධිත තත්ත්වයට පත් වූවන් නොවන බැවින් හා ඔවුන්ට තවදුරටත් රාජකාරී කටයුතු සිදු කිරීමට හැකියාව ඇති බැවින් එම පිරිස වෙත මෙම ප්‍රතිපාදන අදාළ කර නොගැනීම

(ඊ) උක්ත (අ),(ආ) හා (ඇ) හි පරිදි සහන සැලසීමේදී සියදිවි හානි කර ගැනීම, විනය විරෝධී ක්‍රියා සළකා නොබැලීම

(උ) මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය අනුමත වූ 2018.03.20 දින සිට හිඟ ගෙවීම වලින් තොරව එදින සිට බලපැවැත්වෙන සේ සහන සැලසීම

(ඌ) උක්ත (අ), (ආ) සහ (ඇ) හි සඳහන් පරිදි ක්‍රියාන්විත නොවන ප්‍රදේශ වල මෙහෙයුම් රාජකාරිවල යෙදී සිටියදී මරණයට පත්වූ සහ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්ට එම මියයාම හෝ ආබාධිත වීම රාජකාරියට අදාලව සිදුවූවක් බවට අදාළ හමුදාවේ හමුදාධිපති විසින් නිගමනය කර ඇත්නම් පමණක් ඒ සඳහා පිහිටුවන පහත සංයුතියෙන් යුත් කමිටුවක් මඟින් තීරණය කර වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ගෙවීම

- ආරක්ෂක ලේකම්තුමා විසින් නම් කරන ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සභාපති
- මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සාමාජික
- යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සාමාජික
- නාවික හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සාමාජික
- ගුවන් හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් - සාමාජික

ආර්.පී.ආර්. රාජපක්ෂ

වැ.බ. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම

පිටපත් :
1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
3. ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
4. ප්‍රධාන ගණකාධිකාරී, ආරක්ෂක අමාත්‍යාංශය
5. හමුදා සම්බන්ධීකරණ නිලධාරී, ආරක්ෂක අමාත්‍යාංශය

By C of N

Action :- DGS, DG(B&P), DNW, DG(P&P)

Information COS, DGP